**මහඔය ප්‍රාදේශීය සභාව.**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-------------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**----------------------------**

මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ පදනම හා ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු මෝටර් රථ හා කරත්තවල වටිනාකම රු.65,288,562 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.67,471,002 ක් වශයෙන් දැක්වීම නිසා ජංගම නොවන වත්කම් රු.2,182,440 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වාහන අළුත්වැඩියා වියදම් රු.89,900 ක් ප්‍රාග්ධනගත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) UNDP ආධාර හා සභා අරමුදල් යටතේ රු.මිලියන 15 ක් වැයකර 2017 වර්ෂයේ දී ඉදි කර තිබුණු උණුවතුර බුබුල කඩකාමරවල වත්කම ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ඈ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු, 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු රු.360,321 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.311,021 ක් ලෙස දැක්වීම නිසා ජංගම වගකීම් රු.49,300 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ස්ථාවර තැන්පතු 02 කට අදාලව සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.24,998 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.74,000 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.203,795 ක් ලෙස දැක්වීම නිසා ජංගම වත්කම් රු.129,795 ක් වැඩියෙන් දක්වා තිබුණි.

## 1.3.3 ගෙවිය යුතු ගිණුම්

2013 වර්ෂයේ සිට 2017 දක්වා දේශීය ආදායම් දෙපාර්මේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.360,321 ක් 2018 අගෝස්තු 10 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි.

## 1.3.4 අනුකූල නොවීම්

### 1.3.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා රීති 59 - 66 | සෑම වර්ෂයකම ආරම්භයේ ප්‍රදේශය තුළ පරීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අය කළයුතු පාර්ශව හදුනාගෙන ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 1647 (ඉ) | වාහන විෂය භාර නිලධාරීන් විසින් ඒ ඒ වාහනයේ වර්ගය, මෝස්තරය, ලියාපදිංචි අංකය, තමන්ට භාර දුන් දිනය, පැවරූ දිනය හා ඒ හා සම්බන්ධිත තොරතුරු දැක්වෙන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 2006 මැයි 30 දිනැති 09/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පැමිණීමේ හා පිටවීමේ වේලාව දැක්වීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,767,509 ක්, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,777,757 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ රු ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | - | 383 | 383 | - | 50 | 61 | 61 | - |
| (ii) කුලී | 6,612 | 6,013 | 5,902 | 453 | 5,929 | 5,930 | 6,164 | 352 |
| (iii) බලපත්‍ර ගාස්තු | 286 | 302 | 302 | - | 505 | 408 | 408 | - |
| (iv) වෙනත් ආදායම් | 4,778 | 6,391 | 6,019 | 323 | 4,068 | 6,464 | 6,350 | 368 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු මුළු ආදායම රු.13,809,957 ක් වූ අතර, වර්ෂය තුළ රු.12,605,957 ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාලව රු.1,204,000 හිඟහිට තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

සභා බල ප්‍රදේශය මූලික පහසුකම් වලින් සමන්විත ප්‍රදේශයක් වුවද, සභාව විසින් මේ දක්වා වරිපනම් බදු අයකිරීමක් සිදුකර නොමැති අතර, වරිපනම් සඳහා තක්සේරුවක් ලබාගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කිරීමටද කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුලී ආදායම්**

2017 දෙසැම්බර් 31 දිනට රු.453,483 ක් වූ හිඟහිටි කුලී ආදායම අයකර ගැනීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 07 ක් පැවති අතර, 2009 අප්‍රේල් 19 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව දුරකථන කුළුණු සඳහා අවම වශයෙන් එක් කුළුණකට රු.20,000 ක් බැගින් රු.140,000 ක මූලික ගාස්තුවක් අයකර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු.119,333 ක් හා මුද්දර ගාස්තු වශයෙන් රු.67,000 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතහැර දැමූ කර්තව්‍යයන්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුලදී මහඔය උණුවතුර බුබුල අවට පරිසරය නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නවාතැන්පළක් ඉදිකිරීම සඳහා රු.653,779 ක ප්‍රතිපාදන මත, රු.535,936 ක් වැයකර නවාතැන්පළක් ඉදිකර තිබූ නමුත්, 2018 අගෝස්තු 08 දින වනවිටත් එහි වැඩ කටයුතු අවසන් නොකර අත්හැර දමා තිබුණි.

(ii) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ දී මහඔය ප්‍රාදේශීය සභාව වෙත අනුමත කරන ලද ප්‍රතිපාදන වලින් ඉතා සුළු ප්‍රතිපාදනයකට අදාල ඉදිකිරීම් පමණක් සිදුකර තිබුණු අතර, ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට නොහැකි වීම මත ඉතිරි ප්‍රතිපාදන සභාවට අහිමි වී තිබුණි. විස්තර පහත පරිදිය.

| ව්‍යාපෘතිය | අනුමත මුදල | ඉටුකර ඇති වැඩවල වටිනාකම | ඉතිරි ප්‍රතිපාදන |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කැකිරිහේන පොළ අවට නඩත්තු කිරීම | 9,937,593 | 3,083,874 | 6,853,719 |
| උණුවතුර බුබුල අවට පරිසරය නඩත්තු කිරීම. | 10,657,543 | 3,653,229 | 7,004,314 |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම සම්බන්ධව සභාව දැනුවත් වී නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 07 දෙනෙකුගේ පුරප්පාඩු සහ තනතුරු එකක අතිරික්තයක් පැවතුණි.

**(ආ)** සභාවේ සේවය කර ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් 2008 වර්ෂයේ සිට වල සිට අයවිය යුතු රු.25,359 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

----------------------------

### 3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

------------------------------------------------

ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර 09 ක් සම්බන්ධව සිදුකල භෞතික පරීක්ෂාවේ දී එම කඩ කාමර 09 බදු ගිවිසුමට පටහැනිව වර්ෂ 10 කට වඩා වැඩි කාලයක් අතුරු බදු දී තිබූ බව නිරීක්ෂණය විය

### 3.3.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

---------------------------------------------------

සභාව විසින් 2017 වර්ෂයේ දී රු.1,727,209 ක් වැයකර මහඔය උණුවතුර බුබුල ආශ්‍රිතව ඉදිකරන ලද ආපන ශාලා ගොඩනැගිල්ල 2018 සැප්තැම්බර් වනවිටත් කිසිදු පාර්ශයක් වෙත බදු දීමට කටයුතු කර නොතිබීම නිසා සභාවට ලබාගත හැකිව තිබුණු ආදායම් අහිමිවී තිබුණි.

### 3.3.3 පවරා නොගත් වත්කම්

------------------------

සභාවේ විවිධ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ඉඩම් 36ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි.

### 3.3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ 2015 හා 2017 වර්ෂවල රු.මිලියන 40 ක් වැයකර කැකිරිහේන කඩ කාමර 24 කින් සමන්විත සාප්පු සංකීර්ණයක් හා සතිපොළක් ඉදිකර තිබූ අතර, මින් සාප්පු සංකීර්ණයක් කඩ කාමර 24 සඳහා ගිවිසුම් අත්සන් කර කඩ හිමියන් වෙත 2015 හා 2017 වර්ෂවල ලබා දී තිබුණි. 2018 අගෝස්තු 08 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී අදාල කඩ හිමියන් විසින් කඩ ලබාගත් දින සිට වෙළදාම් කටයුතු කර නොමැති බව හා සති පොළ අදාල කාර්ය සඳහා යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 3.3.5 වාහන උපයෝජනය

----------------------

සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 21 කින් වාහන 10 කට අදාලව ඒවායේ වටිනාකම, අයිතිය, සභාව විසින් හඳුනාගෙන නොතිබුණු අතර, එම වාහනවලට අදාලව ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.4 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2017 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, වර්ෂය තුළ දී රු.15,451,739 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 25 ක් සභාව විසින් සිදුකර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 23 වන දින ඉදිරිපත් කර තිබුණි.

## 4.2 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර, සියයට 12 සිට සියයට 75 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින්, අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනය

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කල යුතුව ඇත.

| | පද්ධතිය | | | අඩුපාඩුව |
|---|---|---|---|---|
| | -------- | | | ---------- |
| (අ) | ආදායම් පරිපාලනය | - | (i) | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | | | (ii) | අතුරු ව්‍යවස්ථා නොපැනවීම. |
| | | | (iii) | ආදායම් ප්‍රභව හඳුනා නොගැනීම. |
| (ආ) | අයවැය පාලනය | - | | අයවැය නිසිලෙස පිළියෙල නොකිරීම. |
| (ඇ) | ගබඩා පරිපාලනය | - | | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා නොකිරීම. |
| (ඈ) | වත්කම් පාලනය | - | | ස්ථාවර වත්කම් නිසි පරිදි නඩත්තු නොකිරීම |
| (ඉ) | ගිණුම්කරණය | - | (i) | වත්කම් ගිණුම්ගත නොකිරීම. |
| | | | (ii) | සම්පූර්ණ ලෙස , මුල්‍ය ප්‍රකාශන කට්ටල විගණනයට ඉදිරිපත් නොකිරීම |
| (ඊ) | කොන්ත්‍රාත් පාලනය | - | (i) | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම. |
| | | | (ii) | ඉදිකිරීම් සඳහා ලිපිගොනු නිවැරදිව පවත්වා නොගැනීම |
| | | | (iii) | චක්‍රලේඛ අනුව වැඩ ඉටු කිරීමේ දුර්වලතා පැවතීම |